ගරු අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා, 2014.01.02
ප්‍රධාන ලේකම්,
එක්සත් ජනතා නිදහස් සන්ධානය

ගරු ලේකම්තුමනි,

**පළාත් සභා මැතිවරණ අපේක්ෂකයින් තෝරා ගැනිම සම්බන්ධව,**
**සියලුම දේශපාලන පක්ෂ වලට කරනු ලබන ඉල්ලීමයි.**

පළාත් සභා තුනක නිල කාලය මේ වසර තුල අවසන් වීමට නියමිතව තිබුනද ඉන් දකුණ සහ බස්නාහිර පළාත් සභා පමණක් ජනවාරි මාසයේදී විසුරුවා හැර මාර්තු මාසය තුල ඡන්ද විමසීමට නියමිත බව වාර්තා වේ. ඒ අතර දැනටමත් දේශපාලඥයින්ගේ සමීප ඥාතින් මෙන්ම ජනප්‍රිය නළු නිළියන්, ගායකයින් මෙන්ම ක්‍රීඩකයින්යින් ද මේ සඳහා ඉදිරිපත් කර වීමට ප්‍රධාන දේශපාලන පක්ෂ විසින් තිරණය කොට ගෙන ඇති බව මාධ්‍ය විසින් වැඩිදුරටත් වාර්ථා කොට තිබුණු අතර ඔවුන්ගේ සම්මුඛ සාකච්චාද පුවත් පත් වල පල විය.

දේශපාලන ඥාතිත්වය, ක්‍රීඩකයෙකු වීම, කළාකරුවෙකු වීම ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් වීමට නුසුදුසුකමක් ලෙස අප විශ්වාස නොකරන නමුත් නම් කරනු ලබන අපේක්ෂකයින් දේශපාලන දැක්මක්, දේශපාලන පරිචයක් සහ අත්දැකීම් සහිත සදාචාරාත්මක මෙන්ම සංයමයක් සහිත පුද්ගලයින් විය යුතු බව අප දැඩි සේ විශ්වාස කරමු. එමෙන්ම හුදු පුද්ගලික ප්‍රසිද්ධිය හරහා ඡන්දදායකයින් ග්‍රහණය කර ගැනිමට ඇති හැකියාව පමණක් සුදුසුකමක් ලෙස නොසැලකිය යුතු බව අප අවධාරණය කර සිටින අතර පසුගිය කාලසීමාව තුළ දේශපාලනයට අවතිරණය වූ ජනප්‍රිය චරිත අතරින් කීපදෙනෙකු හැරුණු විට සෙසු පිරිස ජනතා අපේක්ෂා ඉටු කිරීම සඳහා කෙතරම් දායකවූවේද යන්න විමසා බලන්නට කාලය එළඹ ඇතැයි අප විශ්වාස කරමු. මෑත කාලින මහජන නියෝජිතයන්ගේ හැසිරීම් රටා හා ඔවුන්ට එල්ලවූ චෝදනා විශ්ලේෂණය කිරීමෙන් මේ තත්වය වඩා හොඳින් වටහා ගත හැකි බව පැහැදිලි වේ.

පැවැත්වීමට නියමිත ඉදිරි මැතිවරණ වලදීද මේ තත්වය යහපත් කර ගැනිමෙහිලා ඡන්ද දායකයින්ට වඩා වැඩි බලපෑමක් කල හැකි වන්නේ දේශපාලන පක්ෂ වලට බව නොරහසකි. ඡන්ද දායකයින්ට සිදු වනුයේ දේශපාලන පක්ෂ විසින් නම් කරන අපේක්ෂකයින්ගෙන් තමන් කැමති පුද්ගලයින් තෝරා ගැනිමටය. එබැවින් අප අවධාරණය කර සිටින්නේ අපේක්ෂකයින් තෝරා ගැනීමේ දී ඉහත කරුණු පිළිබඳව අවධානය යොමු කර රටටත් ජනතාවටත් සේවය කළ හැකි සදාචාරත්මක දේශපාලන දැක්මක් අවබෝධයක් සහිත පුද්ගලයින් හට පමණක් නාම යෝජනා දිමට කටයුතු කරන ලෙසත්ය.

එමෙන්ම පසුගිය මැතිවරණයේදී දක්නට ලැබුණු එකම පක්ෂයේ අපේක්ෂකයන් අතර සිදුවන මනාප තරඟය මැතිවරණ නීති උල්ලංඝනය කිරීම්, පොදු දේපල මැතිවරණ කටයුතු සඳහා යොදා ගැනීම් සහ ඡන්ද විමසීම් කාලසීමාව තුල මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලබා දෙන උපදෙස් නොතකා හැරීම් ද නිදහස් සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට බාධාකාරී තත්වයන් බව අමුතුවෙන් සඳහන් කල යුතු නැත.

මෙම තත්වය අවම කිරීමෙහිලා මෙවර පැවැත්වීමට නියමිත දකුණ හා බස්නාහිර මැතිවරණ වලදී නාම යෝජනා ලබා දෙන විටම අපේක්ෂකයන් වෙත ආචාරධර්ම පද්ධතියක් ලබා දීමට කටයුතු කරන මෙන් ඔබ දේශපාලන පක්ෂයෙනුත් තරඟ කිරීමට අපේක්ෂිත අනෙකුත් පක්ෂ වලිනුත් අප ඉතාමත් අවධානයෙන් හා ඕනෑකමින් ඉල්ලා සිටිමු. එමෙන්ම ඔබ දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරන අපේක්ෂකයින් තෝරා ගැනීමේ දී අනුගමනය කරනු ලබන නිර්ණායක පිළිබඳවත් ආචාර ධර්ම පිළිබඳවත් ජනතාව දැනුවත් කිරීමට ක්‍රියා කරන්නේ නම් එය ඔබ පක්ෂය ජයග්‍රහණයට හේතුවක් වනු ඇතැයි අප විශ්වාස කරමු.

ස්තුතියි!

මෙයට,

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂක

පිටපත - 01. මැතිවරණ කොමසාරිස්තුමා 02. උනන්දුවක් දක්වනු ලබන සෙසු ආයතන

Mr. Mawai S. Senathirajah 2014.01.02

Secretary,

Ilankai Tamil Arasu Kadchi

Dear Sir,

**Selection of Candidates for Provincial Council Elections- an open request to all parties**

Though the official terms of three provincial councils are slated to end this year, it is reported that the western and southern provincial councils will be dissolved prematurely in January. Recent media reports suggest that political parties have decided to field relatives of politicians, popular actors, actresses and singers as candidates for this election. Their interviews had been published in newspapers.

We do not hold the view that anyone is not fit to be a politician merely because of his or her relationship to a politician, or being an artiste or a sports star. Yet, we strongly uphold the view that candidates should be a lot with political experience and moral discipline. We stress the fact that their sheer popularity should not be used as a vote catching gimmick. Barring a few, it is high time for us to do a performance review of popular artistes who entered politics in recent times. Analysis into the recent conduct of some public representatives will reveal ample details in this respect.

The political parties hold a greater clout in influencing voters for a departure from this practice. Voters have no choice but to elect a few only among those fielded by the respective political parties. Against this backdrop, we call upon you only to nominate persons with political vision, knowledge, moral discipline and commitment to serve the general public.

During past elections, we witnessed how rivalry among candidates for preferential votes ledto the violation of the election, the abuse of state resources and the disregarding of guidelines of the Election Commissioner. It eventually hindered the process of conducting free and fair elections.

As a measure to avert such a situation, we request the political parties to introduce a code of conduct for their candidates at the next election. We believe a public discussion on the code of conduct you propose for your candidates, will eventually translate into a political victory.

Thanking Your,

Rohana Hettiarachchi

Executive Director

Copied to Elections Commissioner and others concerned